# සන්නිවේදන

## ශාස්ත්‍රීය සංග්‍රහය තෙවන වෙළුම 2013

40th
1973
2013
Anniversary
Department of Mass Communication
University of Kelaniya- Sri Lanka

ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ

**සිව් දශක සැමරුම් කලාපය**



**සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර**
*ජනසන්නිවේදන අධ්‍යයන අංශය,*
*කැලණිය විශ්වවිද්‍යාලය.*

# සන්නිවේදනයේ දර්ශනය - ඌණ පූර්ණ කළ යුතු සටහන් පෙළක්

හැම විෂය ක්ෂේත්‍රයකටම ඊටම ආවේණික වූ පසුබිම් දර්ශනයක් පවතියි. මේ පසුබිම් දර්ශනය හඳුන්වනු ලබන්නේ විෂය මාර්ග දර්ශනය (Subject Guiding Philosophy) ලෙසිනි. නූතන සමාජීය විද්‍යා ක්ෂේත්‍රයට අයත් සන්නිවේදන අධ්‍යයනය එබඳු විෂය ක්ෂේත්‍ර ගණනාවකින් බිහිවූ බහුවිෂයක්ග්‍රාහී (Multi Disciplinary Subject) ශික්ෂණයක් වශයෙන් සැලකේ. ඒ විෂය ධාරාවන්හි මූලික අවස්ථාව සැකසෙන්නේ ජීව විද්‍යාව ඇසුරින් බව රේමන් විලියම්ස් (Raymond Williams) සහ ජෝර්ජ් ගාබ්නර් වැනි විද්වතුන් විසින් ද භරතමුණි ආචාර්යවරයා විසින් ද පෙන්වාදී ඇත.[1]

මෙහිලා සන්නිවේදන අධ්‍යයනය (Communication Studies) යන්න බිහිවූයේ විධිමත් ලෙස සමාජ අධ්‍යයනය (Social Studies) හා සමාජ විද්‍යාව (Sociology) යන විෂය ධාරාවන් කෙමෙන් සම්මත ලෙස නැගීමෙනි. එහි ශාඛාවන් සන්නිවේදන අධ්‍යයනයේ හැරවුම් ලක්ෂයන් බවට පත්වූයේ මානව සන්නිවේදනයේ (Human Communication) නැගීමත් සමඟය.[2]

පුරාණ මානව සමාජයේ ප්‍රාචීනවාදී මෙන් ම ප්‍රතිචීනවාදී සමාජයන්හි ද සම්මත ලෙස මානව කණ්ඩායම් (Human Groups) බෙදී පැවතිණ. ඒ මානව කණ්ඩායම් වලට පොදු වූ ජීවන සාධක රාශියකි. ඉන් කිහිපයක් මෙසේ ය.[3]

01. දාරක ප්‍රේමය
02. සටන් කාමය
03. කුතුහලය හෙවත් කුහුල
04. කුසගින්න හා ආහාර සෙවීම
05. ජුගුප්සාව
06. සංචරණය හෙවත් තැනින් තැන යාම
07. සංඥා ගවේෂණය හා භාවිතය
08. ආත්ම, අධිරෝපණය
09. ආත්මාවමානය

10. ලිංගිකත්වය, සම්මත හා අසම්මත
11. නිර්මාණශීලීත්වය
12. ඝාතන වේගය
13. සානුකම්පාව
14. රැකවරණය
15. අධ්‍යාත්මික ගවේෂණය හා සුන්දරත්වය

මෙසේ වර්ගීකරණයකට හසු කළ ද මානව කණ්ඩායම්වල පරිණාමය සමඟ ඔවුන් මගින් වෙසෙසින් සන්නිවේදන ක්‍රියාදාමයන් (Communication Activities) සමුදායක් බිහිවන්නට පටන් ගත්තේ ය.[4]

සන්නිවේදනයේ පුරෝගාමී දර්ශනය ලෙස සැලකිය හැක්කේ මානව ඉන්ද්‍රිය පද්ධතිය (Sensory Perception) කෙමෙන් පුළුල් වී යාමයි. මේ ස්වභාවය වඩාත් මැනවින් හා විද්‍යාත්මකව වටහාදීමට වෑයම් කළ ප්‍රතිචිනවාදී සමාජීය විද්‍යාඥයා ලෙස පිදුම් ලැබිය යුත්තේ මාර්ෂල් මැක්ලූහන් ය.[5] ඔහු ඉන්ද්‍රිය පද්ධතියේ පැවැත්ම වෙනස්වීම හැඳින්වූයේ ඉන්ද්‍රිය සංජනනය කෙමෙන් දිගු වීමක් වශයෙනි.[6] පෙරකී මානව කණ්ඩායම් කෙමෙන් පරිණාමයට පත්වීම යනු සන්නිවේදන පරිණාමයක් (Communication Evolution) වශයෙන් හඳුනාගත යුතු ය. ඒ කෙසේ ද යත් වැස්ස (Rain) යනු ගුප්ත බලවේගයකට වඩා විද්‍යාත්මක සාධක අනුව වටහාගත යුතු සංසිද්ධියක් බවට පත්විය. ජලගැල්ම (Floods) යනු එහිම අතුරුඵලයක් බවට පත්විය. මුහුද ගොඩගැලීම යනු සුනාමියක් (Tsunami) යනුවෙන් හැඳින්විය.

එහෙත් සම්මත චින්තනයෙන් සැදුම්ලත් මානව විඥානයට (Conscience) අනුව වැස්ස වළාහක දෙවියා මානව සමාජයෙන් බැහැර වූයේ නොවේ. වැස්ස වළාහක දෙවියා වෙනත් පරිණාමයකට පත් වෙසක් ගෙන මානව කණ්ඩායම් හමුවේ පෙනී සිටියේ ය. මානව කණ්ඩායම් තම ඉන්ද්‍රිය පරිපථය දිගු නොවූ හැම අවස්ථාවකදීම යාතු කර්ම (Rituals) වලට නැඹුරු වූ වගක් පෙනී යන්නේ එබැවිනි.[7]

යාතු කර්ම විවිධ සමාජ අවස්ථාවලට අනුකූලව ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලක් වශයෙන් භාෂණය (Speech), ගායනය (Singing), නර්තනය (Dancing), රූපණය (Performance), පූජාව හා බිලි පූජාව (Sacrifice) වශයෙන් කෙමෙන් විවිධ වෙස්ගත් බවක් පෙනීයයි. එහි ප්‍රභේද සංස්කෘතීන්ට අනුකූලව අනන්තය. බොහෝ ගවේෂණ හා විමර්ශන සිදුවී පවතියි.[8] මෙහිලා මේ විෂයට අදාළ ශාන්තිකර්ම හා මායාකර්ම කෙමෙන් ජනශ්‍රැතිකාංග (Folklore Elements) බවට පත්විය. එබැවින් මානව සන්නිවේදනයේ පරිණාමයට අනුව ඊට ම බද්ධ වූ ප්‍රධානත ම විෂය ශාඛාව වූයේ ජනශ්‍රැතිවේදය යි. ජනශ්‍රැතිවේදය හෙවත් ජනවිද්‍යාව විධිමත් ලෙස අධ්‍යයන කිරීමේ පසුබිම සැකසෙන්නේ සන්නිවේදන අධ්‍යයනයේ නැගීමෙනි.[9]

එහෙත් කෙමෙන් සන්නිවේදන අධ්‍යයනයේ ප්‍රභේදයන්ට අනුව අතිරේක යෙදුම් කිහිපයක් ම බද්ධවිය. එහිලා ප්‍රධානතම යෙදුම වන්නේ සාම්ප්‍රදායික සන්නිවේදනය (Traditional Communication) යි. සම්ප්‍රදාය (Tradition) හා සාම්ප්‍රදායික සමාජය (Traditional Society) යන්න වඩාත් විවරණය වන්නට පටන් ගත්තේ සමාජ විද්‍යාවේ සන්නිවේදනය නැගීමත් සමඟය.[10]

පළමුව විෂයක් වශයෙන් ස්ථානගත වූයේ සමාජවිද්‍යාව ද නොඑසේ නම් මානව විද්‍යාව ද (Anthropology) යන්න විද්වතුන්ගේ මතවාද වලට ලක් වූ කරුණකි. සමාජ විද්‍යාව වෙනමත් මානව විද්‍යාව වෙනමත් විෂය ශාඛා දෙකක් වශයෙන් බිහි වී ඇතත් මේ විෂයන් දෙක යා කරන ප්‍රබලතම විෂය වූයේ සන්නිවේදනය බව පෙන්නුම් කර දී ඇත.[11] මේ පසුබිමේ දී මානව විද්‍යාව හා බැඳුණු අතුරු විෂය ශාඛා දෙකක් හඳුනාගත හැකි ය. ඒවා නම්,

01. භෞතික මානව විද්‍යාව (Physical Anthropology)
02. සංස්කෘතික මානව විද්‍යාව (Cultural Anthropology)

මේ විෂය ශාඛා දෙකෙහි පවතින අන්තර්ගතය යා කරනු ලැබීම සන්නිවේදන ක්‍රියාදාමයක් වශයෙන් සලකනු ලැබිණ. එබැවින් අප ගවේෂණයේදී සන්නිවේදන දර්ශනය මානව විද්‍යාවෙන් වෙන් කළ නොහැකි ය.[12]

මානව කණ්ඩායම් මගින් භාවිතයට ගන්නා ලද චංචල හා නිශ්චල ආම්පන්න හා උපකරණ (Equipments and materials) හැදෑරීමේ හා ගවේෂණයේ කාර්යය භෞතික මානව විද්‍යා ක්ෂේත්‍රයට අයත් වූ අතර ඊටත් වැඩි අවධානයකින් සංස්කෘතික මානව විද්‍යා ගවේෂණ සිදුවිය. එහිලා මානව කණ්ඩායම් තුළ පැවති චෛතසික අධ්‍යාත්මික (Spiritual) හා අධිමානසික (Metaphysical), ආගමික (Religious) හා විනෝදාස්වාදී (Entertainment) ක්‍රියාදාම විවරණාත්මක අවබෝධයක් කරා යොමුවන්නට විය. මේ හේතුවෙන් වඩාත් ඉස්මතු වී දිස්වූයේ සංස්කෘතික සාධකයන් හි පරම අරමුණක් වූ සෞන්දර්යය හෙවත් සුන්දරත්වය (Aesthetics) කෙරෙහි මිනිසා නැඹුරුවීමයි. ඉංග්‍රිසි බසෙහි Aesthetic සහ Beauty යන්න එක හා සමාන අර්ථ සපයන අතර විටෙක එක් යෙදුමකින් පැවසෙන අර්ථය මැඩගෙන අනික් යෙදුමින් අර්ථ සැපයීමක් සිදුවේ.

මෙකල ජනසන්නිවේදන විෂයට අදාළව සිද්ධාන්තයක් ලෙසින් උගන්වන විනෝදාස්වාදී න්‍යායයන් (Theories of Entertainment) ප්‍රාථමික වශයෙන් රැඳී පවතින්නේ සෞන්දර්ය හා සුන්දරත්වය පදනම් කොටගෙනය.[13]

"සුන්දරත්වය තත්ත්වයකි." යනුවෙන් ආචාර්ය ආනන්ද කුමාරස්වාමි පැවසී ය. ස්වකීය නොබෙල් සම්මාන දේශනයේදී ඇලෙක්සැන්ඩර් සොල්සනිට්සින් ප්‍රකාශ කළේ යැයි පැවසූවේ 'සුන්දරත්වය මගින් ලොව රැකගත හැකි බවය.' (Beauty will save the world) දාර්ශනික සංකල්පයක් වශයෙන් ගත් කල්හි සුන්දරත්වය යනු ගැඹුරුතම සන්නිවේදනයක පදනම වන්නේ ය. ඒ වූ කලී, හුදු භෞතික ස්වභාවය පෙරළා තොරතුරු සම්පාදනයක් ලෙස ප්‍රතිපාදනය වන්නක් නොවේ. එය තොරතුරු සම්පාදන තලය ඉක්මවා පවතින්නකි. එබැවින් එය සන්නිවේදන දර්ශනයක් වන්නේ ය.

විධිමත් ලෙස සමාජ සන්නිවේදන සූත්‍ර හඳුනාගත් දාර්ශනිකයින් වශයෙන් සැලකෙන්නේ ඔගස්තේ කොම්තේ (Auguste Comte), (1798-1857) සහ කාල් මාක්ස් (Karl Marx), (1818-1883) යන චින්තකයෝ ය. ඔවුන් වැඩිදුරටත් පුරෝගාමී සමාජවිද්‍යාඥයන් විසින් හඳුන්වනු ලබන්නේ සමාජ ආකෘතීන් විධිමත් ලෙස ගොඩනගන ලද නිමවුම්කරුවන් වශයෙනි. (Builders of Systemic models of society) විධිමත් සමාජ ආකෘතිය යනු සන්නිවේදන චින්තනයෙන් නිමවෙන්නකි.[14]

දුර අතීතයේ සිට මානව කණ්ඩායම් එහි සන්නිවේදන ක්‍රම අවබෝධයකින් යුතුව ආකෘතිවලට බහාලූ බව ප්‍රංශ සමාජ විද්‍යාඥයෙකු වන බව කොම්තේ පෙන්වා දෙයි. ඔහුගේ න්‍යායයන් ප්‍රබල වෙනස්කම් සහිතව සමාජ චින්තනයක් වශයෙන් සැලසුම් සහගත වූයේ කාල් මාක්ස් අතිනි. මාක්ස් ජර්මනියේ සිට පළමුව ප්‍රංශයටත් එතැනින් මහා බ්‍රිතාන්‍යයටත් පැමිණියේ ය. එහිදී ඔහුගේ සහයකයා වූයේ ෆෙඩ්රික් එංගල්ස් (1820-1895) ය.

මාක්ස් සහ එංගල්ස්ගේ එකතුව සමාජ සන්නිවේදන චින්තනය හුදු දේශපාලන බලය ඉක්ම වූවක් බවට පත්කිරීමක් බවට හේතුවිය. ස්වභාවධර්ම අධ්‍යයනය කරන්නසේ ම මානව චර්යාව හැදෑරිය යුතුය යන කොම්තේගේ ප්‍රකට මතය මාක්ස් සහ එංගල්ස් වර්ධනය කළ හ.[15]

ඉංග්‍රිසි සමාජ චින්තන ලෙස සැලකෙන Laws & Motions සහ Laws of Stability යන්න හැම සමාජයකට ම පොදු ධර්මතාව වුවත් ඒවා පරිණාමයට පත්වන බව පෙන්නුම් කරනු ලැබීය.[16]

මාක්ස් සම්මත ගණයේ සමාජ විද්‍යා චින්තනයෙන් ඔබ්බේ ඇති සමාජ බලවේග (Social Forces) සමුදායක් දක ගත්තේ ය. සමාජයක පැරණි තාක්ෂණයේ හිමිකරුවන් හා කොටස්කරුවන් වෙනස්වන අයුරු පෙන්වාදීමට මාක්ස් වෑයම් කළේ ය. කෘෂි ආර්ථිකයකින් කාර්මික ආර්ථිකයකට මානව කණ්ඩායම් ප්‍රවේශවීම ඔහුගේ සන්නිවේදන චින්තනය විය.[17]

සමාජ යාන්ත්‍රණයේ වෙනස්කම් සිදුවීම ප්‍රාථමික සන්නිවේදන සාධකයකි. සමාජයේ හැම අංශුවක් ම වෙනස්වීමට ගොදුරුවන්නේ ය යන ආගමික චින්තාව (Religious thought) ඉක්ම වූ භෞතික චින්තාවක් පැන නැගෙන්නට විය. එම චින්තනය කෙමෙන් විද්‍යාත්මක ව්‍යුහයකින් වටහාගැනීම සඳහා පවතින තොරතුරු පද්ධතීන් කෙමෙන් ව්‍යාප්ත වන්නට පටන්ගති. තොරතුරු පද්ධති යනු හුදු Information Order යන සංකල්පය ඉක්මවා පවතින විකාශයක් බව මානව කණ්ඩායම් වලට වැටහෙන්නට විය. ඒ අනුව තොරතුරු ගවේෂණය හා නව තොරතුරු සැපයීම විධිමත් පදනමකින් සංයුක්ත වන්නට පටන්ගත්තේ ය. තොරතුරු ලබාගන්නේ කෙසේද යන මූලික ප්‍රශ්නයට සන්නිවේදනාත්මක පිළිතුරු සපයාගත යුතුවිය. ගවේෂණය (Exploration), විමර්ශනය

(Investigate), සෙවීම (Search) යන යෙදුම් පරතරයකින් යුක්තව රටරටවල් වල මානව කණ්ඩායම් (Human Groups) වල ක්‍රියාකාරීත්වයට අනුකූලව පැවතින. මේ හේතුවෙන් සමාජ සන්නිවේදනයේදී මානව කණ්ඩායම ප්‍රමුඛ ඒකකයක් වීය.

එහි නායකත්වය (Leadership) හා එකට බැඳී පැවැත්ම හෙවත් ඥාතීත්වය (Kinship) ඊළග වැදගත් සාධක බවට පත්විය. ඥාතීත්වය පිළිබඳ සංකල්පය හේතුවෙන් ළෙන්ගතුකම ජ්‍යෂ්ඨත්වය හා කණිෂ්ඨත්වය මැනින. භාෂාවක ප්‍රභවය සමඟ ම ඥාතීත්වය මැනවින් විවරණය වන්නට පටන්ගති. ඒ අනුව පියා, මව, සොහොයුරිය, සොහොයුරා, ලේ නෑයා යන අවශේෂ ඥාතීන් පිළිබඳ සම්බන්ධතා ගොඩනැගෙන්නට වීය. තවද, නායකත්වය හා බැඳුණු ගුණාංග කවරේද යන්නත් ඒ සතු වගකීම් හා ආචාරධර්ම (Ethics) පහල වන්නට වීය.

සමාජ ව්‍යුහය (Social Structure) යන්න හා සන්නිවේදන ව්‍යුහය (Communication Structure) එකට බැඳී පවතින් බව හඳුනාගත හැකිවීය. ඒ අනුව බලය (Power) හා රාජ්‍ය (State) යන්න ද රාජ්‍ය ක්‍රම (State System) ද විග්‍රහ වන්නට පටන්ගති.

මේ සියලුම පසුබිම් අනාවරණවලින් ගම්‍ය වන දර්ශනය කවරේද සන්නිවේදනයේ දර්ශනය වූ කලී ආත්ම ගවේෂණයෙන් පරිබාහිර නොවූ බහුවිෂයග්‍රාහි ශික්ෂණයක් නොවන්නේ ද?

**පාදක සටහන්**

01. Raymod, Willams සිය Communication කෘතියේ පළමු පරිච්ඡේදයේ මෙය සඳහන් කරයි.

'Communication begins in the struggle to learn and to describe. To start this process in our minds, and to pass on its results to, we depend on certain communications models, certain rul or conveation, through which we can make contact' (p.19)

02. Harms, L.S. (1974). Human Communication, The new Foundamemtals.

මේ කෘතියෙහි ලා පළමු පරිඡේදයක් On Communication (සන්නිවේදනය ගැන) යනුවෙන් මානව සන්නිවේදනය හැදින්වීම (Introduction to Human Communication) යනුවෙන් අපූරු විවරණයක් සැපයෙ'. විශේෂයෙන් Colin Cherry නමැති ආචාර්යවරයාගේ මානව සන්නිවේදන පුරෝගාමී වරණ සමුදායක් මෙහි සාකච්ඡාවට් ලක් කෙරේ. (බලන්න, 32 පිටුව)

03. හිතෝපදේශය නම් වූ සතු කථා සංග්‍රහයේ මතු දක්වෙන ශ්ලෝකය.

ආහාර නිද්‍රා භය මෛථුනංච - සමාන මේ තද් පශුභිර් නරානම්

ධර්මොහි තෙජාමධිකො - ධර්මේන හීනා පශුභිස්සමානා

එහි අර්ථය නම්

ආදරය, නින්දය, බියය, මෙවුම්දම් සේවනය යන මෙය මිනිසුන්ගේ වුවත්, තිරිසනුන්ගේ, වුවත් එක හා සමානය. ඔවුන්ගේ වනාහි වැඩි විශේෂය නම් යහපත් ක්‍රියා ය. දහමින් හීන වූවෝ සිවුපාවුන් හා සමාන ය.

ආචාර්ය පණ්ඩිත කේ.බී.ඒ එඩ්මන් ලියූ ලිපිය. (සාහිත්‍ය 2002) පැරණි කාම සංකල්පය හා සිංහල සාහිත්‍යය.

04. Bagdikian, Ben. H (1971). The Information Machines; Their Impact on men and the Media. N.Y Harper and Rose

මේ පුරෝගාමී සන්නිවේදන මතවාද සංග්‍රහය මගින් මිනිස් ජීවිතයට සන්නිවේදන යාන්ත්‍රණය බලපාන අයුරු විමර්ශනය කෙරේ. එමගින් සන්නිවේදන දර්ශනය මිනිසා කෙරෙහි බාහිරින් බලපාන අයුරු විභාග කෙරේ.

05. මෙහිලා මාෂල් මැක්ලුහන් විසින් සම්පාදිත කෘතීන් දෙකක් මගින් මානව පැවැත්ම හා ඉන්ද්‍රිය පද්ධතිය පිළිබඳ දිගුවීම පිළිබඳ විවරණය කරයි. ඒවා නම්,

I. McLuhan, Marshall and Quintin Flore (1967),The Medium is the Massage; Tn Inveatory of Effects, N.Y Bantam.

II. Mcluhan (1970). Understanding Media. N.Y

06. Mead, Margeret. (1970). Culture and Communication. A study of the generation gap. N.Y.

07. මේ සඳහා පුරෝගාමී අධ්‍යයනයන් G.S. Frazer විසින් ලියන ලද The golden Bough නමැති කෘතියේ දක්වේ.

08. එම කෘතිය.

09. මේ සඳහා Colin Cherry නම් විද්වතා විසින් ලියන ලද Human Communication කෘතිය බලන්න.